**ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
-----------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමත් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) 2018 දෙසැම්බර් 31 දිනට රු.53,755,452ක් ව පැවති දේපළ පිරියත හා උපකරණවල වටිනාකම 2019 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස රු.62,935,553 වන සේ සංශෝධනය කර තිබුණද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉකුත් වර්ෂයේ සංඛ්‍යාවන් ඒ අනුව සංශෝධිතව ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයට අනුරූප වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 අයවැය කතාවේ 212 ඡේදයට හා 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව ප්‍රග්ධන වියදම් වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදනවලින් එකතුව සියයට 25 ක් ඉතිරි කර ගත යුතු බව දැක්වෙතත් වැය විෂය අංක 280-2-1-0-2506 සඳහා වෙන් කර තිබුණු රු.3,500,000 ක ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් ලෙස වාර්තා වී තිබුණේ රු.651,731 ක් එනම් සියයට 19 ක් පමණක් විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ජාතික අය-වැය දෙපාර්තමේන්තුවට දන්වා මෙම ඉතිරිකිරීම් සිදුකර ඇති බව. |
| (ආ) | මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් යටතේ ලීබඩු හා කාර්යාල උපකරණ සඳහා වෙන් කල මුදලින් සියයට 85ක් එනම් රු.600,000 ක්වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | ප්‍රතිපාදන නිසි සැලසුමකින් යුතුව හා කාර්යක්ෂමව උපයෝජනය කිරිමට කටයුතු කල යුතුවීම. | ජාතික අය-වැය දෙපාර්තමේන්තුවට දන්වා මෙම ඉතිරිකිරිම් සිදුකර ඇති බව. |

**2.2** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදනවල ඉතිරිය ඉක්මවා රු.730,576 ක බැරකම් සඳහා එළඹ තිබුණි. | ප්‍රතිපාදනවල ඉතිරිය ඉක්මවා බැරකම් සඳහා නොඑළඹිය යුතුවීම. | අදහස් දක්වා නොමැත. |

**2.3** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

----------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වසර 4½ ක කාලයක සිට පවතින සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතුව තිබූ රු.139,921 ක්වූ ණය ශේෂය අයකරගෙන නොතිබුණි. | කඩිනමින් ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | ණය ශේෂය අයකර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් ගත යුතු සියළුම ක්‍රියාමාර්ග ගෙන ඇතිබව. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1** **කාර්යසාධනය**

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාර්ෂික කාර්ය සාධන වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය තුල විශේෂ රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීම් 319 ක් සිදු කිරිම හා මුදල් අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති දෙකකට අදාල කාර්යයද ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම සංශෝධනය කරමින් එකී සැලැස්මට අනුව කටයුතු කල යුතුවීම. | ව්‍යාපෘතියේ අධීක්ෂණ ක්‍රියාවලිය තුල එදිනෙදා මතු වන ගැටළුකාරී අවශ්‍යතා මත රැස්වීම් හා සාකච්ඡා පැවැත්වීමට සිදු වන අතර එය ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට හැකියාවක් නොමැති බව. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජුනි මසදී එළි දක්වන ලද ජාතික ඇගයීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස වන ජාතික ඇගයීම් ප්‍රතිපත්ති රාමුව සැකසීම 2020 අගෝස්තු 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කළ යුතුවීම. | එම ප්‍රතිපත්ති රාමුවෙහි අමතර අදියරේ පැවති කෙටුම්පත තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ඒ පිළිබඳව දැනුම, පලපුරුද්ද සහිත ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් රැස්කොට එය වැඩිදියුණු කර විස්තරාත්මක ප්‍රතිපත්ති රාමුවක් සැකසීමට හැකිවූ බව. |

### 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 සඳහන් විධි විධාන ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මුදල් රෙගුලාසි 880 හි සඳහන් විධිවිධාන අනුව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැන්පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. |

## 4. මානව සම්පත් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 106 ක්වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 72 ක් වුයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 34 ක් විය. එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 32ක් විය. මෙම පුරප්පාඩු සංඛ්‍යාව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 7කින්, තෘතීය මට්ටමේ තනතුරු 3කින්, ද්විතික මට්ටමේ තනතුරු 20 කින් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 4කින් සමන්විත වීය. | මෙම තනතුරු පුරප්පාඩුව පැවතීම ආයතනයේ කාර්යසාධනයට අහිතකර ලෙස බලපායි නම් එම තනතුරුවල පුරප්පාඩු පිරවීමටද, එවැනි බලපෑමක් නොමැති නම් අනුමත සේවක සංඛ්‍යාව | පුරප්පාඩුවලට නිලධාරීන් අනුයුක්ත කරන මෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇති බව. |

| | | | |
|---|---|---|---|
| | එලෙස පුරප්පාඩු වී ඇති ජොෂ්ඨ මට්ටමේ තනතුරු 07න් තනතුරු 05ක්ම ක්‍රම සම්පාදන සේවයට අයත් අධ්‍යක්ෂ තනතුරු විය. | සංශෝධනය කිරිමටද අවධානය යොමු කළ යුතුවීම. | |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති හා අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 02 ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | නිරීක්ෂණයට අදාලව අදහස් දක්වා නොමැත. |
| (ඇ) | ඉහත (ආ)හි සඳහන් චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණුවීම් අවස්ථා ලබාදිය යුතු වුවත් පුහුණුවීම් අවස්ථා ලබාදී තිබුණේ නිලධාරින් 23 කට පමණි. එයින් නිලධාරින් 12 දෙනෙකුට ලබාදී තිබුණේ එක් දිනක පුහුණුවක් පමණක් විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | නිරීක්ෂණයට අදාලව අදහස් දක්වා නොමැත. |